# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 27 දරන මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2011 මැයි මස 27 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2011 අංක 27 දරන මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 මැයි මස 25 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 21/2010.

### මහේෂ්වරි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"මහේෂ්වරි පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම ඇති කරන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක 27 දරන "මහේෂ්වරි පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහේෂ්වරි පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මහේෂ්වරි පදනමේ සාමාජිකයන් සහ මින් මතු මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස, ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහේෂ්වරි පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ පාවිච්චි කිරීමට ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරිය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගය වර්ධනය කිරීම;

(ආ) මිනිස් අයිතිවාසිකම්, සාරධර්ම, බහු ජනාවාස වර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම;

(ඇ) ග්‍රාමීය ප්‍රදේශ එහි ඇති ස්වාභාවික සම්පත් උපයෝගී කර ගනිමින් පවත්වාගෙන යා හැකි දියුණුවක් ඇති කිරීම;

(ඈ) ඉහළම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණ ක්‍රම යොදා ගනිමින් කෘෂිකාර්මික හා ධීවර අංශ වැඩිදියුණු කිරීම ;

(ඉ) විද්‍යා අධ්‍යාපනය දියුණු කිරීම සඳහා හා රට සංවර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටුවීම ;

(ඊ) උසස් අධ්‍යාපන ආයතන ශක්තිමත් කිරීම, පර්යේෂණ සඳහා උනන්දු කිරීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(උ) ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් ශක්තිමත් කිරීම සඳහා සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම් උනන්දු කරවීම ;

(ඌ) කාන්තාවන්, ළමුන්, ආබාධිතයන් හා දුප්පතුන්ගේ අභිවෘද්ධිය සැලසීම ;

(එ) මහජනයා සඳහා ක්‍රීඩා, සාහිත්‍ය හා අධ්‍යාත්මික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම ;

(ඒ) දේශීය හා විදේශීය සමාන සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම, එහි අරමුණු වැඩිදියුණු කිරීම සඳහා රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ;

(ඔ) මෙහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දීමනා හා අනෙකුත් මුදල්මය ආධාර දීම;

(ඕ) තරුණයන් සඳහා රැකියා අවස්ථා ලබාදීම සඳහා රාජ්‍ය නියෝජ්‍යායතනවලට සහාය දීම;

(ක) ඉඩම් අහිමි පවුල් සඳහා නිවාස හා ඉඩම් සැපයීම, පාසල් සඳහා ගොඩනැගිලි හා සෙසු අවශ්‍යතා සැපයීම ;

(ග) ගම් සඳහා මාර්ග හා විදුලිය වැනි යටිතල පහසුකම් සැපයීම ;

(ජ) අවශ්‍ය සිසුන්ට ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම සඳහා පන්ති පැවැත්වීම ;

(ට) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු හා විවාද පැවැත්වීම, සංවිධානය කිරීම සහ වැඩිදියුණු කිරීම ;

(ඩ) මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා පොත්, ජර්නල්, වාර සඟරා සහ පුවත් පත් මුද්‍රණය, ප්‍රකාශනය සහ බෙදා හැරීම ;

(ණ) සංස්ථාවට අවශ්‍ය අරමුදල් රැස්කිරීම සඳහා ආදායම් ඉපැයීමේ කාර්යයන්හි නිරත වීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනයේ යෙදවීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන සභාපති, කළමනාකරණ අධ්‍යක්ෂ, පරිපාලන අධ්‍යක්ෂ, මූල්‍ය අධ්‍යක්ෂ, ක්‍රියාත්මක කිරීමේ අධ්‍යක්ෂ, සැලසුම් කිරීමේ අධ්‍යක්ෂ, නීති අධ්‍යක්ෂ, ලේකම් සහ භාණ්ඩාගාරික ඇතුළු නව දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ඩග්ලස් දේවානන්ද මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය. සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම, එවැනි ම රැස්වීමක දී සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන ත්‍යාග, අන්තිම කැමති පත්‍රයකින් පැවරීම, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, විදේශ ආධාර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට ලැබිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා බේරුම් කළයුතු අතර, එදිනට පදනමට ලැබිය යුතුව තිබුණු සියලු ණය මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

9. සංස්ථාවේ කිසිම සාමාජිකයකු පදනමේ ණය හා බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

10. යම් මිලට ගැනීමක්, දායක මුදලක් , ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. සංස්ථාවේ මුද්‍රාව, සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එසේ කරනු ලැබූ අත්සන් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

12.(1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් :—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

13. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, 6 වන වගන්තිය යටතේ සාදන ලද රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.